# වැලිගම නගර සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 11 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට වැලිගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු.26,200 ක් වූ පුස්තකාල පොත් වටිනාකම පුස්තකාල පොත් ගිණුමට බැර කිරීමේ වරද නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල පොත් ගිණුම රු.52,400 ක් හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම බැර කරනු වෙනුවට අධිකතා හා ඌනතා ගිණුම හර කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල රු.500,000 ක් වූ ණයහිමි ප්‍රතිපාදන කපාහැරීම සඳහා ණයහිමි ගිණුම හර කරනු වෙනුවට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම හර කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාල ඉදිකිරීමේ කර්මාන්තයක ණයහිමි ප්‍රතිපාදන කපාහැරීමේ වරද නිවැරදි කිරීම සඳහා ණයහිමි ගිණුම බැර කරනු වෙනුවට රු.30,715 ක් ණයහිමි ගිණුම හර කොට අධිකතා ඌණතා ගිණුම බැර කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගබඩා ණයහිමි ප්‍රතිපාදන ඇති කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.285,861 ක මුදලක් තොග ගිණුම හර කරනු වෙනුවට අධිකතා හා ඌණතා ගිණුම හර කර තිබුණි.

(ඉ) සභාවේ සුපිරි සාප්පු සංකීර්ණය ඉදිකිරීම I අදියර වෙනුවෙන් පුද්ගලික සමාගමක් වෙත රු.3,924,380 ක මුදලක් අත්තිකාරම් ලෙසට ගෙවා තිබුණද මූල්‍ය ප්‍රකාශන වල රු.3,990,630 ක් ලෙසට දක්වා තිබුණෙන් වැඩියෙන් ගිණුම් ගත කළ මුදල රු.66,250 ක් විය.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.93,437 ක තානායම් කුලී මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල මිළදී ගෙන තිබුණු රු.507,600 ක් වටිනා ස්ථාවර වත්කම් ගිණුම් ගතකර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ලෙජරයට අනුව මුද්දර ගාස්තු හිඟ මුදල රු.3,270,890 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එකී මුදල ආදායම් ණයගැතියන් ලෙස ගිණුම්ගත නොකර ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 05 දෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු වශයෙන් අයකරගත යුතු රු.275,022 මුදල ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩාවේ තිබූ රු.783,767 ක් වටිනා වීදී පහන් තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ජංගම වෙළඳ කුටි 10 ක් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ අතර එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබුණු අංක WPRW 8998 දරන රු.345,000 ක් වටිනාකම වූ ට්‍රේලරයේ වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
---------------------------

(අ) ගිණුම් විෂයයන් 10 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයයන්ගේ එකතුව රු.24,742,906 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව හා දෙන ලද තොරතුරු අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.15,452,631 ක වූයෙන් වෙනස රු.9,290,275 ක් විය.

(ආ) ආදායම් විෂයයන් 14 කට අදාල ආදායම් ලෙජරයට අනුව වටිනාකම රු.2,043,945 ක් වුවද කාණ්ඩ එකතු ලේඛනය අනුව වටිනාකම රු.2,753,653 ක් වූයෙන් වෙනස රු.709,708 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
------------------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.5,922,637 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.120,298,990 ක් විය.

(ඇ) නිරවුල් නොකළ ණය ශේෂ
------------------------------

(i) 2014 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව රු.7,637,021 ක් වටිනාකම වූ ගිණුම් 11 ක් 2015 අප්‍රේල් 23 දින වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ පොදු සැපයුම් ණයහිමි ශේෂය තුල ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු.1,282,767 ක ගබඩා ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායම් ණයගැති ශේෂය තුල පැවත එන එකතුව රු.4,737,378 ක් වූ ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
----------------------------------

රු.55,624,678 ක් වටිනා වත්කම් වෙනුවෙන් කාල විශ්ලේෂණ, රු.16,547,842 ක් වටිනා බැරකම් වෙනුවෙන් කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ කිරීම්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,728,198 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.319,552 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 8,300 | 8,818 | 5,136 |
| කුලී මුදල් | 13,235 | 9,644 | 7,372 |
| බලපත්‍ර ගාස්තු | 1,005 | 1,560 | 336 |
| වෙනත් ආදායම් | 178,982 | 168,917 | 55,624 |

#### 2.2.2 වරිපනම් හා බදු

ඉකුත් වර්ෂ වෙනුවෙන් හිඟ මුදල රු.5,103,124 ක් වූ අතර 2014 වර්ෂයේ හිඟ මුදල් අයවීම් රු.1,865,227 ක් විය. මේ අනුව හිඟ වරිපනම් අයවීමේ ප්‍රගතිය සියයට 27 ක්ද 2014 වර්ෂයට බිල්කළ මුදල රු.5,926,885 ක් වූ අතර ඉන් ලැබීම් රු.3,393,455 ක් වූයෙන් අයවීමේ ප්‍රගතිය සියයට 57 ක් විය.

හිඟහිටි වරිපනම් බදු අයකර ගැනීම සඳහා 2013 වර්ෂයේදී තහනම් නියෝග 1552 ක්ද 2014 වර්ෂයේදී 1208 ක්ද, පිළියෙල කර ඇතත් එකී නියෝග සභාපතිවරයා විසින් අත්සන් කර නොතිබූ අතර, දේපල තහනම් කිරීමේ නිලධාරීන්ට වරෙන්තු භාරදීමක්ද සිදුකර නොතිබුණි. තවද කිසිදු දේපලක් තහනමට ගැනීමද සිදුව නොතිබුණි.

#### 2.2.3 බදුකුලී

සමාලෝචිත වර්ෂයට බදුකුලී බිල්කිරීම් වටිනාකම රු.2,950,386 ක් වූ අතර ලැබීම් රු.2,271,105 ක් වූයෙන් අයවීමේ ප්‍රගතිය සියයට 76 ක් විය. 2014 වර්ෂයට පෙර වර්ෂවල හිඟහිටි රු.2,334,619 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ කිසිදු මුදලක් අයවී නොතිබුණි.

#### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 582,236 |
| (ආ) | මුද්දර ගාස්තු | 3,270,890 |

- ❖ නගර සභා (සංශෝධන) ආඥා පනතේ 3(2) සහ 17(11) දරන වගන්ති අනුව කොළඹ රෙජිස්ට්‍රාර් වරයාගෙන් 2008 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල ඔප්පු සඳහා මුද්දර ගාස්තු ලැබී නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3..1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරිමේ (පනතින් සංශෝධිත) 1978 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ පනත පරිදි නගර සභාවේ උප සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් 07 දෙනෙකු විසින් 2012, 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු
----------------------

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අංක 1413/15 හා 2005 ඔක්තෝබර් 05 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 03 රීතිය (1)(1) විධිවිධානයට පටහැනිව අදාල මාසයේ පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම් වලට සහභාගී වී නොමැති මන්ත්‍රීවරුන් 09 දෙනෙකු සඳහා 2014 වර්ෂයේදී සභික දීමනා ලෙසට රු..60,000 ක මුදලක් ගෙවා සභා අරමුදලට පාඩු සිදුකර තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
--------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු මෙසේය.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 05 | 04 | 01 | - |
| ද්විතියික | 37 | 36 | 01 | - |
| ප්‍රාථමික | 86 | 87 | - | 01 |
| අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් | - | 27 | - | 27 |
| | 128 | 154 | 02 | 28 |

සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා වූ වියදම රු.40,765,898 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ රු.36,893,950 ක් පමණක් වූයෙන් සභා අරමුදලට රු.3,871,948 ක අතිරේක වැයබරක් වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

4.1 අයවැය පාලනය
------------------

අයවැයගත ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් වූයෙන් සභාවේ අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයන් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන
---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ සභාපතිවරයාගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය